කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2015

2021 මාර්තු - 2022 ජනවාරි

**සමාජීයවිද්‍යා පීඨය**

**මනෝවිද්‍යාව**

## ඉගෙනුම පිළිබඳ මනෝවිද්‍යාව PSYC E 2035

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

① 'ඉගෙනුම' ( Learning ) යනු කුමක්ද ? ඉගෙනුම පිළිබඳ නිර්වචන මත අර්ථකථනය කරන්න.

② උත්තේජ - ප්‍රතිචාර බන්ධනය මගින් ඉගෙනුම සිදුවන්නේ කෙසේද ? සම්භාව්‍ය ආරෝපණය මත පදනම්ව පැහැදිලි කරන්න.

③ උපස්ථම්භනයක් ( Reinforcement ) යනු කුමක්ද ? ඉගෙනුම සඳහා උපස්ථම්භන ව්‍යවහාර කළ හැක්කේ කෙසේ ද? උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

④ ඊ. එල්. තෝන්ඩයික් විසින් යෝජනා කර ඇති ඉගෙනුම් නීති ( Laws of Learning ) විස්තර කර ඉගෙනුම සඳහා එම නීතීන්ගේ උපයෝගීතාව පෙන්වා දෙන්න.

⑤ ඉගෙනුම කෙරෙහි බලපාන පුද්ගල-බද්ධ සාධක ( subjective factors )මොනවාද ? එම සාධක ඉගෙනුම කෙරෙහි බලපාන්නේ කෙසේද ?

⑥ ඉගෙනුම සාර්ථක කරගැනීමෙහිලා ඔබට අනුගමනය කළ හැකි ඉගෙනුම් කුසලතා ( Learning Skills ) මොනවාද ?

⑦ මතක කුසලතා ( Memory Skills ) ලයිස්තුවක් සකසා මතකය වර්ධනයෙහි ලා එම කුසලතා උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

⑧ පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකකට (02) සටහන් ලියන්න.

I. තැන්වරද ඉගෙනුම
II. දඬුවම්
III. ඉගෙනුම කෙරෙහි බලපාන ආයතනික සාධක
IV. නිරීක්ෂණමය ඉගෙනුම